ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය
2027 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

2027 වර්ෂය සඳහා පහත සඳහන් භාණ්ඩ හා සේවා සැපයීම වෙනුවෙන් ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය සමඟ ලියාපදිංචි වීමට කැමැත්තක් දක්වන රජයේ දෙපාර්තමේන්තු, රජය සතු ව්‍යාපාරික ආයතන, රාජ්‍ය සංස්ථා, පිළිගත් සැපයුම්කරුවන්, දේශීය නියෝජිතයන්, නිෂ්පාදකයන්, වෙළෙඳුන් සහ ව්‍යාපාරික ආයතන වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

එක් එක් කාණ්ඩය සඳහා රු. 1,000.00 බැගින් වූ ලියාපදිංචි ගාස්තුව වෙන වෙනම ගෙවීමෙන්, අයදුම්කරුවන්ට එක් කාණ්ඩයකට හෝ කාණ්ඩ කිහිපයකට අයදුම් කළ හැකිය.

සෑම අයදුම්පතක් සමඟම ආපසු ගෙවනු නොලබන රු. 1,000.00 ක ලියාපදිංචි ගාස්තුව ගෙවිය යුතුය. ඒ සඳහා මහජන බැංකුවේ ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය නමින් පවත්වාගෙන යනු ලබන අංක (228 1001 9000 1704) දරන ගිණුමට මුදල් බැර කර ලබාගත් බැංකු රිසිට්පත හෝ විශ්වවිද්‍යාලයේ මුදල් අයකැමි කවුන්ටරය වෙත මුදල් ගෙවා ලබාගත් රිසිට්පත අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය. බැංකු අණකර, චෙක්පත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

සැපයුම්කරුවන්ට 2027 වර්ෂය සඳහා ලියාපදිංචි වීමේ අවස්ථාව සලසා දී ඇති අතර, ඒ සඳහා www.seu.ac.lk වෙබ් අඩවියට පිවිසිය හැකිය. සැපයුම්කරුවන්ට තම අභිමතය පරිදි අතින් පුරවන ලද අයදුම්පතක් (Manual Application) මඟින් හෝ මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ ලියාපදිංචි විය හැකිය. ඒ අනුව, බැංකු රිසිට්පත ඇතුළුව අදාළ සහතික හා අනෙකුත් මූලික ලේඛන ඉදිරිපත් කළ යුතුය. අදාළ අයදුම්පත විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවියෙන් බාගත කරගත හැකිය.

ඕනෑම අයදුම්පතක් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතු වේ. මිල ගණන් කැඳවනු ලබන අඛණ්ඩ අවස්ථා තුනකදී (03) ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වන සැපයුම්කරුවන්ගේ නම්, 2027 වර්ෂය සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ නාමලේඛනයෙන් පූර්ව දැනුම්දීමකින් තොරව ඉවත් කරනු ලැබේ.

සාමාන්‍යයෙන් භාණ්ඩ හා සේවා සඳහා මිල ගණන් කැඳවීම ලියාපදිංචි සැපයුම්කරුවන් වෙතින් සිදු කරනු ලබන නමුත්, අවශ්‍ය අවස්ථාවලදී වෙනත් සුදුසු සැපයුම්කරුවන් වෙතින් ද මිල ගණන් කැඳවීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතු වේ.

2027 වර්ෂය සඳහා ලියාපදිංචි වන සැපයුම්කරුවන් අවම වශයෙන් දින 45ක ණය පහසුකම් කාලයක් ලබාදීමට එකඟ විය යුතුය. ලියාපදිංචි වීමෙන් පසුව හෝ මෙම කොන්දේසිය උල්ලංඝනය කරන සැපයුම්කරුවකුගේ අදාළ ලංසුව ප්‍රතික්ෂේප කිරීමට කටයුතු කරනු ලැබේ.

ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක්, අදාළ නම් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද හෝ සහතික කරන ලද එකතු කළ අගය මත බදු (VAT) ලියාපදිංචි සහතිකයේ පිටපතක් සහ අනෙකුත් අදාළ ලේඛන අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය. අවශ්‍ය සහතික ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ අයදුම්පත් මෙන්ම අසම්පූර්ණ අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සෑම අයදුම්කරුවකුම තම ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ සඳහන් ව්‍යාපාරික කටයුතුවලට අදාළ භාණ්ඩ හා සේවා සැපයීම සඳහා පමණක් ලියාපදිංචි වීමට අයදුම් කළ යුතුය. මෙම කොන්දේසියට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මාර්ගගත ක්‍රමය ඔස්සේ ලියාපදිංචි වන සැපයුම්කරුවන්, ලියාපදිංචි වීමෙන් අනතුරුව, මූලික අයදුම්පතේ සහ ඉහත සඳහන් සහතිකවල පැහැදිලි ඡායා පිටපත් හැකි ඉක්මනින් විශ්වවිද්‍යාලය වෙත එවීමට කටයුතු කළ යුතුය. මාර්ගගත ක්‍රමය ඔස්සේ ලියාපදිංචි වීම සඳහා අවසාන දිනය 2026.12.05 වේ.

සියලුම අයදුම්පත් අඩංගු ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ **“සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම – 2027”** යනුවෙන් සඳහන් කළ යුතුය. එම අයදුම්පත් 2026.12.05 දින හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, නැතහොත් විශ්වවිද්‍යාලයේ සැපයුම් අංශය වෙත පැමිණ භාරදිය හැකිය.

මේ පිළිබඳ වැඩිදුර තොරතුරු 067-2255178 හෝ 067-2255001 යන දුරකථන අංක ඔස්සේ විමසිය හැකිය.

ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය
විශ්වවිද්‍යාල උද්‍යානය, ඔලුවිල් – 32360.